# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1987 අංක 34 දරන පෞද්ගලික බස්රථ සේවා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 ජූනි මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1987 ජූනි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිළ : ශත 30 යි    තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1987 අංක 34 දරන පෞද්ගලික බස්රථ සේවා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 ජූනි මස 25 වන දින.]

එල්. ඩී.—ඕ. 45/86

**1983 අංක 44 දරන පෞද්ගලික බස්රථ සේවා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1987 අංක 34 දරන පෞද්ගලික බස්රථ සේවා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1985 අංක 38 දරන පනතින් ඇතුළත් කරන ලද, 1983 අංක 44 දරන පෞද්ගලික බස්රථ සේවා පනතේ 28අ වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1983 අංක 44 දරන පනතේ 28අ වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) පෞද්ගලික බස්රථවල තනි පාවිච්චිය පිණිස සලසා ඇති බස් නැවතුම් පොළක් පාවිච්චි කිරීම සඳහා පෞද්ගලික බස්රථයකින් පළාත් පාලන ආයතනයක් විසින් අය කරනු ලැබිය යුතු ගාස්තුව—

(අ) ඒ පළාත් පාලන ආයතනය විසින් ඒ බස් නැවතුම් පොළෙහි ජලය, විදුලිබලය සහ වැසිකිළි පහසුකම් සහිතව මගීන් සඳහා ආවරණයක් සහ වේලා සටහන්කරුවන් සඳහා කුටියක් ද සලසා ඇති අවස්ථාවක, එක් බස් රථයකින් මසකට රුපියල් එක් සියයක් වූ උපරිමයකට ; සහ

(ආ) ඒ බස් නැවතුම් පොළේ කාර්ය සඳහා ඒ පළාත් පාලන ආයතනය විසින් ඉඩමක් පමණක් ලබා දී, (අ) ඡේදයෙහි සඳහන් පහසුකම් දිස්ත්‍රික්ක සමිතියක් විසින් සලසා ඇති අවස්ථාවක, එක් බස් රථයකින් මසකට රුපියල් පනහක් වූ උපරිමයකට යටත්ව ඒ පළාත් පාලන ආයතනය විසින් නිශ්චය කරනු ලැබිය යුතුය." ; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ ඇති "යම් මුදලක් ඒ පළාත් පාලන ආයතනය විසින් අයකර ගනු නොලැබිය යුතුය." යන වචන වෙනුවට "(1) වන උපවගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු යම් ගාස්තුවක් ඒ පළාත් පාලන ආයතනය විසින් අය කර ගනු නොලැබිය යුතුය." යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.